සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

- **අංක 01 සිට 40 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01 රෝමයට ගිය ශ්‍රී ලාංකික තානාපතිවරයෙක් ගෙන ආ වීදුරු පබළුවලින් රුවන්වැලි සෑය අලංකාර කිරීමට පියවර ගත්තේ,

(1) දුටුගැමුණු රජතුමා ය. (2) භාතිකාභය රජතුමා ය.
(3) වංකනාසිකතිස්ස රජතුමා ය. (4) කිත්සිරිමෙවන් රජතුමා ය.

02 වල්ලිපුරම් රන් සන්නසේ සඳහන් වන ආකාරයට වසභ රජතුමාගේ කාලයේ යාපනය ප්‍රදේශය පාලනය වූයේ,

(1) ඉසිගිරි නම් ඇමතිවරයෙක් යටතේ ය.
(2) කිත්ති නගරගිරි නම් සෙනෙවියෙක් යටතේ ය.
(3) භල්ලුක නම් යුවරජකෙනෙකු යටතේ ය.
(4) මහානාග නම් යුවරජකෙනෙකු යටතේ ය.

03 දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය සමය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) දසවෙනි රාජ්‍ය වර්ෂයේ දී ග්‍රාම සීමා නියම කිරීම.
(2) ප්‍රාදේශීය පාලකයින් පරදවා බලය තහවුරු කර ගැනීම.
(3) පංච කකුධ භාණ්ඩ ප්‍රයෝජනයට ගෙන දෙවන වරටත් අභිෂේක උත්සවයක් පැවැත්වීම.
(4) පරුමකවරු සිය ගණනක් රැස්කොට රාජකාරි භාරදීම.

04 මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ක්‍රියාත්මක වූයේ කුඩා වැව් ආශ්‍රයෙනි. ජනතාව විසින් එකල අතහැර දමන ලද වැව් ගම් හඳුන්වන ලද්දේ,

(1) නියම්ගම් වශයෙනි. (2) පට්ඨානගම් වශයෙනි.
(3) කේවට්ට ගම් වශයෙනි. (4) ඔළගම් වශයෙනි.

05 පූර්ව රාජ්‍ය සමයේ පරුමකවරුන්ට කිසියම් ආකාරයක ප්‍රාදේශීය පාලන බලයක් හිමිවී තිබූ බව තහවුරු වන සෙල්ලිපියක් හමුවී ඇත්තේ,

(1) හෙන්නානිගල නම් ස්ථානයෙනි.
(2) සිතුල්පව්ව නම් ස්ථානයෙනි.
(3) කණ්ඩලම ප්‍රදේශයේ කොත්ගල්කන්ද නම් ස්ථානයෙනි.
(4) සීගිරිය ආසන්නයේ කුම්භකාරගාම නම් ස්ථානයෙනි.

06 ප්‍රාග් ඓතිහාසික ජනයාගේ ප්‍රධාන ජීවන මාර්ගය වූයේ,

(1) දඩයම් කිරීම හා ආහාර රැස්කිරීමයි.
(2) හේන් ගොවිතැන හා වන ද්‍රව්‍ය රැස්කිරීමයි.
(3) රෙදි විවීම හා වළං සෑදීමයි.
(4) ලෝහ භාණ්ඩ නිපදවීම හා රෙදිපිළි සකස් කිරීමයි.

07 අභිලේඛණ සකස් කිරීම සඳහා යොදාගත් මාධ්‍යයන් අතුරින් දැව ප්‍රයෝජනයට ගෙන ලියා ඇති ලේඛන හමුවන ස්ථානයක් නම්,

(1) පනාකඩුව තඹ සන්නසයි. (2) වල්ලිපුරම් රන් සන්නසයි.
(3) ඇම්බැක්කේ දේවාලයේ කණුවලයි. (4) සීගිරි ගලේ බටහිර ලෙන් තුළයි.

08 අතීතයේ නිර්මාණය කර ඇති සෙල්ලිපි අතර සකස් කරගත් ගල් කුළුණු මත ලියා ඇති ලිපි හඳුන්වනු ලබන්නේ,

(1) ගිරි ලිපි වශයෙනි. (2) ටැම් ලිපි වශයෙනි.
(3) ආසන ලිපි වශයෙනි. (4) ලෙන් ලිපි වශයෙනි.

09 ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු සපයා ගතහැකි විදේශීය සාහිත්‍යමය මූලාශ්‍රයන් අතර ඕලන්ද මූලාශ්‍රයක් වන්නේ,

(1) රොබට් නොක්ස්ගේ එදා හෙළ දිව (2) බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය
(3) ඉබන්බතුතාගේ දේශාටන වාර්තාව (4) රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය

10 ප්‍රශස්ති කාව්‍ය ගණයට අයත් මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙස සැළකිය හැක්කේ,

(1) සැළලිහිණි සන්දේශය (2) ගුත්තිල කාව්‍යය

(3) බුදුගුණාලංකාරය (4) පැරකුම්බා සිරිත

11 ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන්ගේ ජීවිතය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය වන ස්ථානයක් නම්,

(1) පාහියන්ගල ලෙනයි. (2) මහනුවර පේරාදෙණියයි.

(3) පොම්පරිප්පු නම් ස්ථානයයි. (4) ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශයයි.

12 ප්‍රාග් ඓතිහාසික යුගයට වඩා පූර්ව ඓතිහාසික යුගයේ පවතින වෙනසක් නම්,

(1) ලෝහ භාවිතය ආරම්භ වීමයි.

(2) ගල් මෙවලම් භාවිතා කිරීමයි.

(3) සතුන් දඩයම් කිරීමෙන් ආහාර සපයා ගැනීමයි.

(4) මිනිස් ඇටසැකිළිවල ගුරු ගල් ආලේප කිරීමයි.

13 රාජත්ව සංකල්පය වර්ධනය වන අවධියේ දී ''පර්වතරාජ'' යන සංකල්පයෙන් පෙනී සිටීමට උත්සාහ කළ රජකෙනෙකු වන්නේ,

(1) මහසෙන් (2) කුටකණ්ණ අභය

(3) පළමුවන කාශ්‍යප (4) නිශ්ශංකමල්ල

14 ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසුව රාජ්‍ය පරිපාලන සැකැස්මට අනුව ''බතගු'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) භෝජන ශාලා අධිකාරි (2) සිරිත්විරිත් පිළිබඳ අධිකාරි

(3) භාණ්ඩාගාරික (4) නගර පරිපාලක

15 ''සිත්නාරුබිම මුදල්නා'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) දුටුගැමුණු රජුගේ දසමහා යෝධයින් බාරව සිටි තැනැත්තාය.

(2) පළමුවන විජයබාහු රජුට රැකවරණය දුන් ආරක්ෂක නිලධාරියෙකි.

(3) වසභ රජු යටතේ සේවය කළ ප්‍රාදේශීය පාලකයෙකි.

(4) චෝල පාලකයින්ට එරෙහිව කටයුතු කළ පණ්ඩුකාභය රජුගේ නිලධාරියෙකි.

16 තමන්ගේ සොහොයුරිය පාණ්ඩ්‍ය කුමරකුහට විවාහ කරදීමෙන් ඥාති සබඳතා හරහා ස්ථාවර දේශපාලන බලයක් ගොඩනගාගැනීමට ක්‍රියා කළ පොළොන්නරු පාලකයා

(1) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (2) මහා පරාක්‍රමබාහු

(3) පරාක්‍රම පාණ්ඩ්‍ය (4) පළමුවෙනි විජයබාහු

17 විසි වතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් සිදුවූයේ,

(1) දෙවන අග්ගබෝධි රජුගේ කාලයේ දී ය.

(2) හයවැනි අග්ගබෝධි රජුගේ කාලයේ දී ය.

(3) කණිට්ඨතිස්ස රජතුමාගේ කාලයේ දී ය.

(4) ඉළනාග රජතුමාගේ කාලයේ දී ය.

18 බුද්ධදාස රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශනයක් නම්

(1) රටපුරා වෙජ්ජසාලා පිහිටුවා ජනතාවගේ සුවසෙත පිණිස ක්‍රියා කළේය.

(2) ගැබිණි මව්වරුන් සඳහා මාතෘ නිවාස ඉදිකරවීය.

(3) පත්තිනි දේවාලයක් විවෘත කිරීම සඳහා කේරළ රටට ගියේය.

(4) තිලෝක සුන්දරී නම් කාලිංග කුමරියක් විවාහ කර ගත්තේ ය.

19 කාශ්‍යප කුමරුට ධාතුසේන රජුගෙන් රාජ්‍යය පැහැර ගැනීමට සිදුවූයේ,

(1) අග බිසවගේ දරුවන්ට පමණක් රාජ්‍යය හිමිවන නිසාය.

(2) තමාගේ මව ධාතුසේන රජුගේ දෙවන බිසවක් නිසා තමන්ට රජකම හිමි නොවන නිසාය.

(3) තමාට රජකම නොදී බාල සොහොයුරාට රජකම දීමට පියරජු ක්‍රියා කළ නිසාය.

(4) රජතුමා සියලුම ධනය මුගලන් කුමරුට දෙන අපේක්ෂාවෙන් සඟවා ගෙන සිටි නිසාය.

20 බෞද්ධ සාහිත්‍යයේ ''නවදළිහේන'' යන වචනය ව්‍යවහාර කර තිබෙන්නේ,

(1) අලුතින් ගිනි තබා සකස්කරගත් හේනක් හැඳින්වීමටයි.

(2) බෝග වර්ග නවයක් සරුවට වැවී තිබෙන හේනක් හැඳින්වීමටයි.

(3) ගිනිතබා ඉතිරි වූ ලී දඬුවලින් වැටක් සකස්කර ගත් හේනක් හැඳින්වීමටයි.

(4) හේන ආරක්ෂාකර ගැනීම පිණිස පැලක් සකස් නොකළ හේනක් හැඳින්වීමටයි.

21 සොර බොර වැව ටැම් ලිපියේ සඳහන් වන ආකාරයට හෝපිටිගමු පදියේ සිදුවූ වෙළඳාම ගැන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) වෙළඳාම බදුලු ජනතාවගේ ප්‍රධානම ජීවන මාර්ගය විය.

(2) වෙළඳපොල පසුකර යන කරත්තවලින් පමණක් බදු අය කළ යුතුය.

(3) පෝය දිනවල වෙළඳාම් කළ අය දඩයක් වශයෙන් මහියංගනය විහාරයේ පහන් දැල්වීමට තෙල් සැපයිය යුතුය.

(4) ගෝකණ්ණතිත්ථ වරායෙන් පමණක් භාණ්ඩ පිටරටවලට ගෙනයා යුතුය.

22 මහාතිත්ථ, කාලතිත්ථ, ගිම්හතිත්ථ යන ස්ථාන සම්බන්ධ පොදු ප්‍රකාශනයක් නම්,

(1) අතීතයේ වරායයන් ලෙස භාවිතා වූ ස්ථාන වේ.

(2) විදේශ වෙළඳුන් භාණ්ඩ රැස්කිරීම සඳහා නැවතී සිටි ස්ථාන වේ.

(3) විවිධ රටවල වෙළෙඳුන් හමුවී ගනුදෙනු තීරණය කළ ස්ථාන වේ.

(4) ගංගාවලින් එගොඩවීම සඳහා තොටුපල ලෙස භාවිත කළ ස්ථාන වේ.

23 වැව්අමුණු තනවා ආර්ථිකයේ දියුණුවට කළ මෙහෙය නිසා ''මින්නේරි දෙවියන්'' ලෙස පූජනීයත්වයට පත්වූයේ,

(1) වසභ රජතුමා ය. (2) ධාතුසේන රජතුමා ය.

(3) මහසෙන් රජතුමා ය. (4) පණ්ඩුකාභය රජතුමාය.

24 අතීතයේ පවා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළෙඳුන්ගේ අවධානයට ලක්වීමට බලපෑ හේතුවක් වූයේ,

(1) ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීමයි.

(2) ඉන්දියානු සාගරය හරහා තිබූ මුහුදු සේද මාර්ගයේ මැද පිහිටීමයි.

(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමයි.

(4) එකල ඉන්දියන් සාගර ප්‍රදේශයේ වෙළඳ කටයුතු වර්ධනය වෙමින් පැවතීමයි.

25 ගමික සිව, ගමික සුමන, ගමික තිදන යන පුද්ගලයින් පිළිබඳව සඳහන් වන්නේ,

(1) සංඛපාල විහාර භූමියේ ඇති සෙල්ලිපියකය.

(2) සිතුල්පව්ව විහාර භූමියට අයත් සෙල්ලිපියකය.

(3) අනුරාධපුර පෙරිමියන්කුලමේ සෙල්ලිපියකය.

(4) ඉසුරුමුණි විහාරයේ සෙල්ලිපියකය.

26 කණ්ඩලම ප්‍රදේශයේ කොත්ගල්කන්ද නම් ස්ථානයේ සෙල්ලිපියකට අනුව ''තොට බොජක'' යන පදයෙන් අදහස් කර ඇත්තේ,

(1) ගල්ගුහාවක් කරවා පූජා කළ පුද්ගලයකු බවයි.

(2) තොටුපලෙන් අයබදු ලබාගත් පුද්ගලයකු බවයි.

(3) භික්ෂූන් වහන්සේලාට වත් පිළිවෙත් ඉටුකළ පුද්ගලයෙකු බවයි.

(4) ගොවිතැනට අවශ්‍ය ජලය ලබාදුන් පුද්ගලයකු බවයි.

27 මුල් ඓතිහාසික යුගයේ ජනාවාස අතර ''පරික්ඛිත්ත ගම්'' වශයෙන් හඳුන්වා ඇත්තේ

(1) වැටකින් ආරක්ෂා කර තිබූ ගමකි.

(2) කිසිම ආරක්ෂාවක් නොතිබූ ගමකි.

(3) නාගරික ජනාවාසයක් ආසන්නයේ තිබූ ගමකි.

(4) වෙළෙඳුන් වැඩි වශයෙන් ගැවසුනු ගමකි.

28 උඩරංචාමඩම ප්‍රදේශයේ කැණීම් කළ පැරණි නිවාස භූමියෙන් හමුවී ඇති ගුරුගල් වලින් සනාථ වන කරුණ වන්නේ,

(1) එකල කාන්තාවන් තම රූ සපුව අලංකාර කර ගැනීමට දැක්වූ උනන්දුවයි.

(2) අවමංගල සිරිත් ඉතා ක්‍රමානුකූලව ඉටුකළ බවයි.

(3) උත්සව අවස්ථාවලදී වර්ණ ආලේප කළ බවයි.

(4) ගුරුගල් උරච්චිකොට ලබාගත් වර්ණ වලින් මැටි භාණ්ඩ අලංකාර කළ බවයි.

29 ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති පැරණිතම කාසි වර්ගය වන්නේ,

(1) තඹ මස්සයි. (2) ලක්ෂ්මී කාසියයි.

(3) ස්වස්තික කාසියයි. (4) කහාපණ නම් කාසි වර්ගයයි.

30 පැරණි කාන්තාවන්ගේ ඇඳුම්පැළඳුම්, ආභරණ, කොණ්ඩ මෝස්තර වැනි තොරතුරු වඩාත්ම හොඳින් අනාවරණය වන්නේ,

(1) සිතුල්පව්වේ ලෙන් චිත්‍රවලිනි. (2) සීගිරි චිත්‍රවලිනි.

(3) ඉසුරුමුනි විහාර කැටයම් වලිනි. (4) මහියංගන විහාරයේ මූර්තිවලිනි.

The National e-learning Portal for The General Education

31 මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා, ඇරිස්ටෝටල්ගේ සිමුන්ඩෝ වැනි කෘති අයත්වන්නේ,

(1) ග්‍රීක මූලාශ්‍ර ගණයටයි. (2) රෝම මූලාශ්‍ර ගණයටයි.

(3) චීන මූලාශ්‍ර ගණයටයි. (4) පෘතුගීසි මූලාශ්‍ර ගණයටයි.

32 සාහිත්‍යමය මූලාශ්‍ර නිසා සැලසෙන ප්‍රයෝජනයක් විය නොහැක්කේ,

(1) ඒ ඒ යුගවල තොරතුරු අධ්‍යයනය කිරීමට හැකිවීම.

(2) විදේශීය සම්බන්ධතා අධ්‍යයනය කිරීමට හැකිවීම.

(3) සෙල්ලිපි මගින් තහවුරු කර ගැනීමට හැකිවීම.

(4) එක් මූලාශ්‍රයක සඳහන් තොරතුරු තවත් එකකින් සනාථ කර ගැනීමට හැකිවීම.

33 මහා වංශයේ හා දීප වංශයේ ඇතුළත් ඇතැම් තොරතුරු අතර සමාන තත්වයක් පෙන්වීමට හේතුවක් වන්නේ,

(1) මෙම දෙකටම මූලාශ්‍රය වශයෙන් එකම ග්‍රන්ථවල ආභාෂය ලැබීමයි.

(2) ග්‍රන්ථ දෙකම සමාන කාලවකවානුවක් සම්බන්ධ කොට ලියා තිබීමයි.

(3) ග්‍රන්ථ දෙකටම සමාන භාෂා ශෛලියක් යොදාගැනීමට සිදුවීමයි.

(4) දීප වංශයේ සඳහන් කරුණු මූලාශ්‍රය ලෙස ගෙන මහා වංශය රචනා කර තිබීමයි.

34 ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමට වැදගත්වන ග්‍රන්ථ දෙකක් නම්,

(1) රාජාවලිය හා නිකාය සංග්‍රහයයි.

(2) සීතාවක හටන හා මයුර සන්දේශයයි.

(3) සැවුල් සන්දේශය හා පැරකුම්බා සිරිතයි.

(4) දළදා සිරිත හා සසදාවතයි.

35 සිලප්පදිකාරම්, මණිමේකලායි, පදිර්රුපත්තු යන ග්‍රන්ථ සම්බන්ධ පොදු ප්‍රකාශනයක් වන්නේ,

(1) ශ්‍රී ලංකාව ගැන තොරතුරු සඳහන් අරාබි ග්‍රන්ථයන්ය.

(2) ශ්‍රී ලංකාව ගැන තොරතුරු ඇතුළත් දකුණු ඉන්දීය ග්‍රන්ථයන්ය.

(3) ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර පැවැති වෙළඳාම ගැන සඳහන් ග්‍රන්ථයන්ය.

(4) යාපන රාජධානිය පිළිබඳව තොරතුරු ඇතුළත් ග්‍රන්ථයන්ය.

36 කාසි, නටබුන්, චිත්‍ර, මූර්ති, පුරාවස්තු ආදිය අයත්වන්නේ,

(1) දේශීය මූලාශ්‍ර ගණයටයි. (2) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ගණයටයි.

(3) සාහිත්‍යමය මූලාශ්‍ර ගණයටයි. (4) නාණක මූලාශ්‍ර ගණයටයි.

37 ඓතිහාසික මූලාශ්‍ර පිළිබඳව කියැවෙන නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

(1) සාහිත්‍යමය මූලාශ්‍රවල සඳහන් සමහර කරුණු සෙල්ලිපිවලින් තහවුරු වේ.

(2) සෙල්ලිපිවල සඳහන් කරුණුවලින් කාල නිර්ණය දැනගත නොහැකි වේ.

(3) ඓතිහාසික මූලාශ්‍රවල බොහෝ තොරතුරු නිවැරදි බව තහවුරු වී ඇත.

(4) පුරා විද්‍යාත්මක නටබුන් දක්නට ලැබෙන්නේ රජරට ප්‍රදේශවල පමණි.

38 ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ගල්වල කොටා ඇති ඉරහඳ රූප, දුන්නර්තලය, හක්ගෙඩිය ආදී රූපවලින් නිරූපනය වන්නේ,

(1) එම ස්ථානවල වටිනා නිධන් වස්තු තැන්පත් කර ඇති බවයි.

(2) පැරණි සන්නිවේදන ක්‍රමයකි.

(3) වැරදි කළ අයට දඬුවම් ලැබෙන බවයි.

(4) විවිධ ප්‍රදේශ අතර ගමන් කිරීමට යොදාගත් මාර්ග බවයි.

39 රොබට් නොක්ස් නම් ඉංග්‍රීසි ජාතික නැව්පතියා ශ්‍රී ලංකාවේ සිරකරුවකු බවට පත්වූයේ,

(1) දෙවෙනි රාජසිංහ රජුගේ කාලයේ දී ය.

(2) පළමුවෙනි රාජසිංහ රජුගේ කාලයේ දී ය.

(3) පළමුවෙනි විමලධර්මසූරිය රජුගේ කාලයේ දී ය.

(4) දෙවෙනි විමලධර්මසූරිය රජුගේ කාලයේ දී ය.

40 ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්ථාන අතුරින් කාලවකවානු කීපයකට අයත් තොරතුරු හමුවී ඇති ස්ථානයක් වන්නේ,

(1) බෙල්ලන් බැඳි පැලැස්සයි. (2) කිතුල්ගල බෙලි ලෙනයි.

(3) පාහියන්ගල ලෙනයි. (4) නිල්ගලයි.

(2 x 40 = 80)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# ඉතිහාසය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 (1) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

මාන්තායි / උරුවේල / කාලතිත්ථ / දේවනගර / කදුරුගොඩ / පාහියන්ගල / අරුවිආරු / යාන්ඔය / මිනිහාගල්කන්ද / ජම්බුකෝළ පට්ටන (ල. 10)

(2)



A



B



C

(i) a. A අක්ෂරයෙන් ඉදිරිපත් කර ඇති නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

b. මෙය කරවූ රජතුමා කවුද?

c. කවර රාජධානි යුගයකට අයත් සේ සැලකේද?

d. මෙහි වැදගත්කම දැක්වෙන අදහසක් ලියන්න. (ල. 04)

(ii) a. B අක්ෂරයෙන් පෙන්නුම් කරන්නේ පැරණි ලියැවිල්ලකි. එය කුමක් ද?

b. මීට සම්බන්ධ රජතුමා කවරෙක්ද?

c. මෙය කීවෙනි ශතවර්ෂයේදී කරවන ලද්දක්ද? (ල. 03)

(3) (a) C අක්ෂරයෙන් දැක්වෙන පින්තූරයේ සඳහන් වන්නේ කුමක්ද?

(b) මෙම නිර්මාණයෙන් අපට තහවුරු වන ඓතිහාසික නිගමනයක් ලියන්න.

(c) ඉහත නිර්මාණය සඳහා යොදාගෙන ඇති මාධ්‍යය කුමක්ද? (ල. 03)

(4) ගැළපෙන වචන යොදා පහත ප්‍රකාශනවල හිස්තැන් පුරවන්න.

(i) මෙරට දාහත්වන සියවසේ සමාජ ආර්ථික තොරතුරු රැසක් හෙළිවන ''එදා හෙළදිව'' නම් ග්‍රන්ථය ඉංග්‍රීසි ජාතිකයකු වූ ........................................... විසින් ලියන ලද්දකි.

(ii) අතීතයේ රජදරුවන් විසින් ගල් මත ලියවන ලද ලේඛන ...................................... නමින් හඳුන්වනු ලැබේ.

(iii) ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද්දේ ආදි කාලීන ......................................... මානවයා විසින් යයි විද්වතුන් පිළිගත් මතයයි.

(iv) චීනයේ සිට මෙරටට වැඩම කළ ......................................... භික්ෂුව අභයගිරි විහාරයේ වාසය කරමින් බෞද්ධ ධර්මය හදාරා ඇත.

(v) අග්නි හා පර්ජන්‍ය දෙවිවරුන් නිරූපිත සේ සැලකෙන ........................................... නම් මූර්තිය අනුරාධපුර ඉසුරුමුනි විහාරයේ පර්වත බිත්තියේ දක්නට ලැබේ. (ල. 05)

(5) කෙටි පිළිතුරු සපයන්න.

(i) තඹ තහඩුවක ලියැවී ඇති අභිලේඛණය හඳුන්වන නම ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ සිතියමක් ප්‍රථමයෙන්ම තම ග්‍රන්ථයට ඇතුළත් කළ භූගෝල විද්‍යාඥයා කවුරුන්ද?

(iii) කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල යටිගම්පිටිය ආසන්නයේ පිහිටි පැරණිම ප්‍රාග් ඓතිහාසික ස්ථානය නම් කරන්න.

(iv) අතීතයේ වරායයන් ආශ්‍රිතව නිර්මාණය වූ ගම් හැඳින්වූ නම ලියන්න.

(v) ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු සඳහන්වන මුල්ම කෘතිය නම් කරන්න. (ල. 05)

02 (i) ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති විදේශීය කාසි වර්ග තුනක් නම් කරන්න.

(ii) පැරණි කාසි පිළිබඳව අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම දක්වෙන කරුණු 2 ක් ඉදිරිපත් කරන්න.

(iii) ඉතිහාසය විෂයය ඉගෙනීමේ ඇති වැදගත්කම කරුණු 2 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(iv) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර යනු මොනවාදැයි සඳහන් කර ඒවා ආරක්ෂා කර ගැනීමේ ඇති වැදගත්කම කරුණු 2 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

03 (i) (a) විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම ආරම්භ කිරීම

(b) පරාජයට පත් ප්‍රතිමල්ලවයාගේ සොහොනට නිසි ගෞරවාචාර දක්වීමට පියවර ගැනීම.

(c) පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගැනීම.

ඉහත ප්‍රකාශනවලට සම්බන්ධ රජවරුන් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගතවීමෙන් පසුව පරිපාලන කටයුතුවලට සම්බන්ධ වූ රාජ්‍ය නිලධාරීන් 4 දෙනෙක් නම් කරන්න.

(iii) ''පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය වැඩි වශයෙන්ම හිමිවූයේ පියාගෙන් පුතාට හා සහෝදරයාගෙන් සහෝදරයාටයි.'' මෙම අදහස උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

(iv) සැලසුම් සහගත සංග්‍රාම ව්‍යාපාරයකින් චෝල බලය මැඩපැවැත්වීමට පළමුවන විජයබාහු රජතුමා ක්‍රියාකර ඇති බව කරුණු ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

04 (i) මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස ව්‍යාප්තියට බලපා ඇති සාධක 3 ක් දක්වන්න.

(ii) ඒ ඒ ප්‍රදේශවල ජීවත් වූ වෘත්තිකයින් මුල්කරගෙන එකල ජනාවාස හඳුන්වා තිබේ. එවැනි ජනාවාස වර්ග 4 ක් නම් කරන්න.

(iii) ඉහත ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය වෙන වෙනම විස්තර කරන්න.

(iv) මෙම ජනාවාසවල ජීවත් වූ ජනයාගේ ජීවන රටාව කෙබඳු ස්වරූපයක එකක්වීදැයි විස්තර කරන්න.

05 (i) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස හමුවී ඇති ස්ථාන 3 ක් සඳහන් කරන්න.

(ii) (a) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් මෙවලම් හමුවී ඇති ස්ථාන 2 ක් ලියන්න.

(b) එසේ හමුවී තිබෙන මෙවලම් වර්ග දෙකක් නම් කරන්න.

(iii) එකල ජනයා ආහාර සකස් කරගත් ආකාරය කරුණු 2 ක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(iv) පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි හමුවී ඇති ස්ථාන 2 ක් සඳහන් කර එම ස්ථානවලින් හෙළිවන සමාජයීය තොරතුරු විස්තර කරන්න.

06 (i) (a) පැරණි ගම්වල සුළු ආරවුල් විසඳීම.

(b) පොදු කටයුතුවලදී ඒ ඒ පවුල් නියෝජනය කිරීම.

(c) වැව් ගම් කීපයක වැසියන්ගේ ශුභසිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීම.

ඉහත කාර්යයන් හා සම්බන්ධ පූර්ව රාජ්‍ය සමයට අයත් නිලධාරීන් පිළිවෙලින් නම් කරන්න.

(ii) මෙරට ප්‍රථම පාලකයා වශයෙන් පණ්ඩුකාභය රජතුමා රාජත්වයේ වර්ධනය පිණිස ගෙන ඇති පියවර දෙකක් සඳහන් කරන්න.

(iii) දේවානම්පියතිස්ස, වසභ වැනි රජවරුන් ප්‍රාදේශීය පාලකයින්ගේ සහයෝගය ලබාගනිමින් තම පාලන කටයුතු සාර්ථකව පවත්වාගෙන ගිය ආකාරය විස්තර කරන්න.

(01) (1) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම.




The National e-learning Portal for the General Education